**ජාතික ඉතිරි කිරීමේ බැංකුව - 2014**

2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ("බැංකුව") මූල්‍ය ප්‍රකාශන සහ එහි පරිපාලිතයන්ගේ (සමූහය) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනතේ 37 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. බැංකුවේ ශාඛා 15 ක් විගණනය කිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලී වරලත් ගණකාධිකාරි සමාගම් 15 ක් මට සහාය වන ලදී. පරිපාලිතයෙහි මූල්‍ය ප්‍රකාශන එම පරිපාලිතයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලී වරලත් ගණකාධිකාරි සමාගමක් විසින් විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය - බැංකුව

මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**මතය - සමූහය**

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ හා එහි පරිපාලිතයෙහි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ලාභාංශ ලෙස රු.මිලියන 4,000 ක මුදලක් බැංකුව විසින් භාණ්ඩාගාරයට ගෙවා තිබුණි. භාණ්ඩාගාරයේ ලේකම් විසින් නිකුත් කරන ලද 2010 අප්‍රේල් 29 දිනැති අංක එම්ඕඑෆ්/එෆ්එම්ඒයු/ බදු/ ලාභාංශ දරන ලිපිය අනුව, ලාභාංශ ගෙවීම අවම වශයෙන් බදු පසු ලාභයෙන් සියයට 30 ක් හෝ හිමිකම්වලින් සියයට 15 ක් යන දෙකෙන් වැඩි අගයට විය යුතුය. එබැවින් ඉහත ලිපියෙන් ලබාදී තිබූ උපදෙස් වලට පටහැනිව බැංකුව විසින් රු.මිලියන 510.96 ක වැඩිපුර ගෙවීමක් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස බැංකුවේ හිමිකම් සහ වත්කම් 2014 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 510.96 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) භෞතිකව තිබූ රු.4,131,738 ක් වටිනා ස්ථාවර වත්කම්, භෞතික සමීක්ෂණ වාර්තාවේ නිරූපණය වී නොතිබූ අතර ස්ථාවර වත්කම් ලේඛනයේ දැක්වෙන රු.14,290,872 ක් වූ ස්ථාවර වත්කම් ශාඛාවල භෞතිකව නොතිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ස්ථාවර වත්කම්වල නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

#### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

පොදු ලෙජරයේ දැක්වෙන ශේෂයන් සහ අදාළ පාර්ශවයන්ගෙන් ලබාගත් උපලේඛන/ පද්ධති / සනාථ කිරීම්වල දැක්වෙන අනුරූපී ශේෂයන් අතර පහත සඳහන් පැහැදිලි නොකළ වෙනස්කම් නිරීක්ෂණය විය.

| අයිතමය | පොදු ලෙජරය අනුව මුදල | අදාළ උපලේඛන/ පද්ධති/ සනාථ කිරීම් අනුව මුදල | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| උකස් අත්තිකාරම් මත අත්හැර දැමූ පොලී | 1,444,112,514 | 1,436,000,000 | 8,112,514 |
| ලැබිය යුතු උකස් ප්‍රාග්ධනය | 33,195,655,836 | 33,193,638,670 | 2,017,166 |
| ලැබිය යුතු උකස් පොලී | 4,988,985,574 | 4,562,264,731 | 426,720,843 |

| | | | |
|---|---|---|---|
| ණය සහ අත්තිකාරම් - ප්‍රාග්ධනය | 152,428 | 95,652 | 56,776 |
| තැපැල්පති ශුද්ධ ශේෂය | 98,547,448 | 121,485,722 | 22,938,274 |

### 2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අක්‍රීය ගිණුම් මත මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු රු.688,955,417 කින් රු.349,747,209 ක මුදලක් නිරවුල් කිරීමෙන් තොරව වර්ෂ 5 කට වැඩි කාලයක් හිඟ හිටව පැවතුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාජ ආපසු ගැනීම් හා මුදල් අයකැමි ඌනතා පිළිවෙලින් රු.26,533,088 ක් හා රු.1,510,900 ක් විය. ඉන් රු.17,638,522 ක් හා රු.1,400,000 ක් පිළිවෙලින් වර්ෂ 1 කට හා වර්ෂ 3 කට වැඩි කාලයක් හිඟ හිටව පැවතුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට වැඩ තහනම් කරන ලද හා සේවය අතහැර ගිය සේවකයින්ගෙන් සහ වෙනත් පාර්ශ්වයන්ගෙන් ලැබිය යුතු ශේෂ පිළිවෙලින් රු.5,124,716 ක් හා රු.20,467,466 ක් විය. ඉන් රු.3,640,444 ක් හා රු.8,238,233 ක් පිළිවෙලින් වර්ෂ 5 කට හා වර්ෂ 3 කට වැඩි කාලයක් හිඟ හිටව පැවතුණි.

(ඈ) තැන්පතු නිෂ්කාෂණ ගිණුම්වල හා වෙනත් වගකීම්වල දැක්වෙන පිළිවෙලින් රු.2,699,061 ක් හා රු.3,522,755 ක් වූ ශේෂ වර්ෂ තුනකට වැඩි කාලයක් නිරවුල් කිරීමෙන් තොරව පරිශේෂව පැවතුණි.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීම් බැංකු පනතේ 47 වගන්තිය | ගිණුමක් අක්‍රීයව පවත්නා අවස්ථාවකදී එවැනි ගිණුම්වල පවතින ශේෂ "හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට" (Unclaimed Deposits Reserve ) මාරු කළ යුතුය. කෙසේ වුවද බැංකුව 2007 වර්ෂයේ සිට මෙම අවශ්‍යතාවයට අනුකූලවී නොතිබූ අතර 2014 දෙසැම්බර් 31 දිනට හිමිකම් නොපෑ තැන්පතු ප්‍රමාණය රු.3,394,845,461 ක් විය. |
| (ආ) | 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත | 2014 වර්ෂය සඳහා බැංකුව විසින් අදාළ සේවකයන්ගේ වැටුප්වලින් අයකර ගැනීමෙන් තොරව රු.58,108,398 ක මුදලක් උපයන විට ගෙවීම් බදු ලෙස එහි අරමුදල්වලින් ගෙවා තිබුණි. |
| (ඇ) | 2007 අංක 10 දරන පනතින් සංශෝධිත 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත | ශාඛා 6 ක් විසින් අවස්ථා 97 කදී බැංකු ගිණුම් විවෘත කිරීමේදී ඉල්ලුම් පත්‍රය සමඟ බදු ප්‍රකාශන වාර්තා ගනුදෙනුකරුවන්ගෙන් ලබාගෙන නොතිබුණි. |

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය
---------------------------------------------

| | | |
|---|---|---|
| (i) | 5.2.4 වගන්තිය | මුදල් වර්ෂය ආරම්භවීමට මාස 3 කට පෙර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා කෙටුම්පත් අයවැය ලේඛනය ඉදිරිපත් කළ යුතු වුවද පසුගිය වර්ෂ 5 කට වැඩි කාලයක් වාර්ෂික අයවැය ලේඛනයට අනුමැතිය ලබාගැනීමේදී බැංකුව විසින් මෙම අවශ්‍යතාවයට අනුකූල වී නොතිබුණි. |
| (ii) | 5.2.5 වගන්තිය | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සහ යාවත්කාලීන කරන ලද අවසාන අයවැය ලේඛනයේ පිටපත් ඊළඟ වර්ෂය ආරම්භවීමට දින 15 කට පෙර රේඛීය අමාත්‍යාංශයට, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට, මහා භාණ්ඩාගාරයට හා විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද 2014 වර්ෂය සඳහා අයවැය ලේඛනය 2014 ජනවාරි 29 දින ඉදිරිපත් කර තිබුණි. |

(ඉ) 2006 ඔක්තෝබර් 05 දිනැති අංක 06 දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2006 ජනවාරි 25 දිනැති අංක 8 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනයේ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ චක්‍රලේඛය

| | | |
|---|---|---|
| (i) | 2.14.1 මාර්ගෝපදේශය | රු.මිලියන 100 කට වැඩි හෝ එයට සමාන වටිනාකමක් ඇති කොන්ත්‍රාත්තු අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කළ යුතුය. කෙසේ වුවද රු.මිලියන 127 කට ආරක්ෂක සේවා බාහිරින් ලබාගැනීමේ කොන්ත්‍රාත්තුවේදී එපරිදි සලකා නොතිබුණි. |
| (ii) | 2.12 මාර්ගෝපදේශය | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික ඇගයීම් කමිටුවේ සියළු සාමාජිකයින් විසින් එහි පළමු රැස්වීමේදී නිශ්චිත ආකෘතියක ප්‍රකාශයක් අත්සන් කළ යුතු අතර එම ප්‍රකාශයන් අවම වශයෙන් වර්ෂ 5 ක කාලපරිච්ඡේදයක් ආරක්ෂාකාරීව තබා ගත යුතුය. කෙසේ වුවද අවස්ථා 6 කදී ඉදිරිපත් කරන ලද රු.53,262,117 ක් වටිනා කොන්ත්‍රාත් සම්බන්ධයෙන් මෙම අවශ්‍යතාවයට අනුකූල වී නොතිබුණි. |
| (iii) | 8.9.1 (ආ) මාර්ගෝපදේශය | කොන්ත්‍රාත් වටිනාකම රු.500,000 ඉක්මවීමේදී විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කළ යුතුය. එසේ වුවද රු.448,425,067 ක් වටිනා භාණ්ඩ ප්‍රසම්පාදනය සඳහා අවස්ථා 140 කදී මෙම අවශ්‍යතාවය සම්පූර්ණ කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ හා සමූහයේ මෙහෙයුම් ප්‍රතිඵල පිළිවෙලින් රු.මිලියන 10,472 ක හා රු.මිලියන 10,764 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බැංකුවේ හා සමූහයේ බදු පූර්ව ශුද්ධ ලාභය පිළිවෙලින් රු.මිලියන 2,279 ක් හා රු. මිලියන 2,669 ක් වූයෙන් පිළිවෙලින් රු.මිලියන 8,193 කින් හෙවත් සියයට 359 කින් හා රු.මිලියන 8,095 කින් හෙවත් සියයට 303 කින් බැංකුවේ හා සමූහයේ මූල්‍ය ප්‍රතිඵලවල වර්ධනයක් දැක්වුණි. සමාලෝචිත වර්ෂය තුළ ශුද්ධ පොලී ආන්තිකය වැඩිවීම, මූල්‍ය ආයෝජන අපහරණයේදී ලාභ ඉපැයීම සහ වෙළඳාම සඳහා තබාගත් ආයෝජන අපහරණය කිරීම මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

#### (අ) වැදගත් ගිණුම්කරණ අනුපාත

ලබාගත හැකිවූ තොරතුරු අනුව, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා බැංකුවේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| | | ආංශික අනුපාත * | 2014 | 2013 |
|---|---|---|---|---|
| **(අ)** | **ලාභදායිත්ව අනුපාත** | | | |
| (i) | සාමාන්‍ය කොටස්කරුවන්ගේ අරමුදල් මත ප්‍රතිලාභ (ROE) (ප්‍රතිශතය ) | 14.34 | 30.2 | 5.1 |
| (ii) | සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ (ROA) (ප්‍රතිශතය) | 2.19 | 1.5 | 0.4 |
| (iii) | ශුද්ධ පොලී ආන්තිකය (ප්‍රතිශතය) | 3.63 | 3.0 | 1.7 |
| **(ආ)** | **ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය** | | | |
| (i) | මුළු වත්කම් වලට හිමිකම් (වාර ගණන ) | ලබාගත නොහැක | 1:33.51 | 1:29.45 |
| (ii) | ප්‍රාග්ධන ප්‍රමාණතා - පෙළ I (ප්‍රතිශතය) | 23.25 | 20.5 | 18.5 |
| (iii) | ප්‍රාග්ධන ප්‍රමාණතා - පෙළ II (ප්‍රතිශතය) | 20.62 | 19.0 | 16.7 |
| **(ඇ)** | **ද්‍රවශීලතා අනුපාතය** | | | |
| | ද්‍රවශීල වත්කම් අනුපාතය (ප්‍රතිශතය) | 67.76 | 91.5 | 92.7 |

* ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රසිද්ධ කරන ලද බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට අදාළ වාර්ෂික සංඛ්‍යා ලේඛනවල වර්ෂ 10 ක සාමාන්‍යය.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළදී සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ හා ශුද්ධ පොලී ආන්තිකය පිළිවෙලින් සියයට 275 කින් හා සියයට 76 කින් වැඩිවී තිබුණු අතර එය සාමාන්‍ය බලපත්‍රලාභී විශේෂිත බැංකු අනුපාතය වන පිළිවෙලින් සියයට 2.19 ට හා සියයට 3.63 ට වඩා අඩුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලබාගත හැකිවූ තොරතුරු අනුව, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ බැංකුවේ මෙහෙයුම් කාර්ය සාධනය පහත දැක්වේ.

| | 2014 | 2013 |
|---|---|---|
| ශාඛා සංඛ්‍යාව | 236 | 229 |
| තැපැල් ශාඛා සංඛ්‍යාව | 4,063 | 4,063 |
| ගිණුම්හිමියන් සංඛ්‍යාව (මිලියන ) | 18.3 | 17.9 |
| ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) සංඛ්‍යාව | 260 | 247 |
| පාසැල් බැංකු ඒකක සංඛ්‍යාව | 2,287 | 1,723 |

සමාලෝචිත වර්ෂය තුළ ශාඛා 7 ක් අළුතින් ස්ථාපිත කරන ලද අතර ගිණුම් හිමියන් සංඛ්‍යාව දළ වශයෙන් 400,000 දක්වා වැඩිවී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය 247 සිට 260 දක්වා වැඩිවී තිබුණි.

(ආ) ශාඛාවල ලාභදායීත්වය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

i. 2014 වර්ෂය තුළ ශාඛා 42 ක් හා අංශ 2 ක් විසින් දරන ලද මුළු පාඩුව රු.242,077,891 ක් විය.

ii. 2013 වර්ෂය සමඟ සැසඳීමේදී 2014 වර්ෂය තුළ ණය හා ජාත්‍යන්තර අංශයේ ලාභය පිළිවෙලින් රු.544,785,829 කින් හා රු.59,506,261 කින් හෙවත් සියයට 40 කින් හා සියයට 39 කින් අඩුවී තිබුණි.

iii. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ "රිදී රේඛා " හා ඊ - බැංකු අංශයේ අඛණ්ඩ පාඩු පිළිවෙලින් රු.872,263 කින් හා රු.3,403,373 කින් හෙවත් සියයට 02 කින් සහ සියයට 10 කින් වැඩිවී තිබුණි.

### 4.2 ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කිරීම - 2013 සහ 2014

2012 දෙසැම්බර් 19 දිනැති අංක 12/1767/504/163 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, යටිතල පහසුකම් ව්‍යාපෘති සංවර්ධනය සඳහා ණය ලබාදීමේ අරමුණින් එජඩො මිලියන 1,000 ක ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව බැංකුව විසින් වර්ෂයකට පිළිවෙලින් සියයට 8.875 ක හා සියයට 5.15 ක පොලී අනුපාතයට 2013 වර්ෂයේදී එජඩො මිලියන 750 ක හා 2014 වර්ෂයේදී එජඩො මිලියන 250 ක ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කර තිබුණි. අමාත්‍ය මණ්ඩල තීරණය හා බැංකුවේ ඉදිරිපත් කිරීම් ලියවිල්ල (Offering Memorandum ) අනුව බැඳුම්කර

මුදලින් සියයට 50 ක් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල , සියයට 25 ක් එක්සත් ජනපද ඩොලර් නාමික ණයවල හා සියයට 25ක් ශ්‍රී ලංකා රුපියල් නාමික ණයවල ආයෝජනය කිරීමට නියෝග කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ..

i. එජඩො 750 ක මුදලින් සියයට 50 ක් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනය කර තිබුණද අමාත්‍ය මණ්ඩල තීරණයට හා බැංකුවේ ඉදිරිපත් කිරීම් ලියවිල්ලට (Offering Memorandum ) අනුකූල වීමෙන් තොරව රු.මිලියන 48,812 හෙවත් එජඩො 375 ක් වන ඉතිරි සියයට 50 ක මුදල 2014 දෙසැම්බර් 31 දිනය දක්වා භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කර තිබුණි. තවද 2013 වර්ෂයේ බැඳුම්කර මුදල්වලින් නාමික ඩොලර් ණය හා නාමික රුපියල් ණය ලෙස එජඩො මිලියන 177.3 ක හා රු.මිලියන 25,097.3 ක ණය මුදලක් ලබාදීම සඳහා අනුමැතිය ලබාගෙන තිබූ නමුත් එම අනුමැතිය සැලකීමෙන් තොරව බැංකුව විසින් ස්වකීය අරමුදල්වලින් එජඩො මිලියන 69.8 ක් හා රු.මිලියන 12,012.2 ක මුදලක් වියදම් කර තිබුණි.

ii. 2014 වර්ෂයේ නිකුත් කරන ලද සම්පූර්ණ බැඳුම්කර මුදල බැංකුවේ ඉදිරිපත් කිරීමේ ලියවිල්ලේ අවශ්‍යතාවය සැලකීමෙන් තොරව භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කර තිබුණි. එජඩො මිලියන 51.3 ක හා රු.මිලියන 5,000 ක ණය මුදල් ලබාදීමට අනුමැතිය ලබාගෙන තිබුණද, එම මුදලින් කිසිඳු ණය මුදලක් බැංකුව විසින් වියදම් කර නොතිබුණි.

### 4.3 නව ශාඛා ඉදිකිරීමේ ප්‍රමාදය

2008, 2009 හා 2011 වර්ෂවලදී බැංකු ශාඛා ඉදිකිරීම සඳහා පානදුර, බම්බලපිටිය, ගල්කිස්ස, නුගේගොඩ, කතරගම හා මීගමුව පිහිටි ඉඩම් 6 ක් අත්පත් කර ගෙන තිබුණද, ඉදිකිරීම් වැඩ 2014 දෙසැම්බර් 31 දක්වාම නිමකර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස එම ශාඛා පවත්වාගෙන යාම සඳහා කුලී පදනම යටතේ ලබාගෙන තිබූ ගොඩනැඟිලිවලට 2014 වර්ෂයේදීද රු.7,545,000 ක කුලී ගෙවීමට සිදුවී තිබුණි. කෙසේ වුවද නිශ්චිත කාලපරිච්ඡේදය තුළ ඉදිකිරීම් වැඩ නිම කළේ නම් එසේ ගෙවන ලද කුලිය ඉතිරි කර ගත හැකිව තිබුණි.

### 4.4 ණය පරිපාලනය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂය තුළ ලබාදුන් මුළු ණය හා අත්තිකාරම් සහ බැංකුවේ අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කරන ලද ණය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ණය වර්ගය | 2014 දෙසැම්බර් 31 දිනට තත්ත්වය | | | | 2013 දෙසැම්බර් 31 දිනට තත්ත්වය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | මුළු ණය හා අත්තිකාරම් | | අක්‍රීය ණය | | මුළු ණය හා අත්තිකාරම් | | අක්‍රීය ණය | |
| | ණය සංඛ්‍යාව | මුදල රු.මිලියන | ණය සංඛ්‍යාව | මුදල රු.මිලියන | ණය සංඛ්‍යාව | මුදල රු.මිලියන | ණය සංඛ්‍යාව | මුදල රු.මිලියන |
| අලංකාර ණය | 97 | 83 | 7 | 5 | 83 | 66.30 | 6 | 4.22 |
| වාහන ණය | 9,516 | 787 | 299 | 30 | 297 | 301.56 | 2 | 1.07 |
| වානිජ ණය | 1 | 1,000 | - | - | 2 | 1,192.96 | 0 | 0 |
| විදේශ ණය | 243 | 364 | 49 | 73 | 233 | 387.02 | 61 | 111.34 |
| රජයේ ණය | 36,454 | 24,257 | 1,154 | 651 | 31,133 | 21,112.56 | 1,462 | 813.89 |
| නිවාස හා දේපල ණය | 30,344 | 23,080 | 3,117 | 1,623 | 31,034 | 22,962.48 | 4,116 | 2,172.77 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| නි.දෙ. ණය - මිහිඳු | 3 | 2 | 2 | 1 | 4 | 3.99 | 3 | 1.8 |
| ජා.නි.ස. ජන සෙවන | 7 | 3,576 | - | - | 5 | 2,476.00 | 0 | 0 |
| ඇප මත පුද්ගලික ණය | 60,051 | 13,539 | 3,047 | 355 | 30,488 | 5,440.63 | 1,770 | 175.1 |
| උකස්මත පුද්ගලික ණය | 165 | 143 | 29 | 36 | 183 | 154.37 | 34 | 37.39 |
| ව්‍යාපෘති ණය | 66 | 79,418 | 1 | 30 | 21 | 15,872.53 | 0 | 0 |
| සේවක ණය | 18,072 | 4,309 | - | - | 10,133 | 3,232.94 | 0 | 0 |
| සේවක වාහන ණය | 400 | 141 | - | - | - | - | - | - |
| විශ්ව විද්‍යාල සේවක නිවාස ණය | 291 | 263 | 12 | 11 | 191 | 174.49 | 78 | 6.55 |
| සේවක යතුරු පැදි ණය | 29 | 2 | - | - | - | - | - | - |
| දිරි පියස | 14 | 4 | - | - | - | - | - | - |
| රට ඉතුරු ණය | 742 | 46 | 498 | 26 | - | - | - | - |
| වෙනත් | 01 | 1,414 | - | - | 574 | 33.32 | 427 | 20.57 |
| එකතුව | 156,496 | 152,428 | 8,215 | 2,842 | 104,381 | 73,411.15 | 7,959 | 3,344.72 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අක්‍රීය ණය

2014 හා 2013 වර්ෂවල මුළු ණය වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස මුළු අක්‍රීය ණය වටිනාකම පිළිවෙලින් සියයට 1.86 ක් හා සියයට 4.5 ක් විය. රු.මිලියන 40,928 ක් වූ නව ව්‍යාපෘති ණය වියදම සැලකීමේදී අක්‍රීය ණය අනුපාතය සියයට 1.86 දක්වා අඩුවී තිබුණි.

(ආ) අයකර නොගත් සේවක ණය හා අත්තිකාරම්

i. නිලධාරීන් විශ්‍රාම යන අවස්ථාවේදී අයකර ගත යුතු ණය වටිනාකම 2014 දෙසැම්බර් 31 දිනට රු.11,577,369 ක්ව පැවතුණි.

ii. 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.2,791,077,000 ක සේවක ණය තුළ වැඩ තහනම් කළ හා සේවය අතහැර ගිය නිලධාරීන් 45 ක ගෙන් අයවිය යුතු රු.5,124,718 ක මුදලක් ඇතුළත් වී තිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 90,479 ක මුළු අනුමත ව්‍යාපෘති ණය මුදල් වලින් මාර්ග සංවර්ධන අධිකාරියට අනුමත කරන ලද ණය රු.මිලියන 55,371 ක මුදලක් නියෝජනය විය. එයින් රු.මිලියන 11,711 ක් හෙවත් සියයට 24 ක් 2014 දෙසැම්බර් මාසය තුළ මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවීම් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවන ලද මුළු මුදල රු.මිලියන 49,218 ක් විය. කෙසේ වුවද ව්‍යාපෘති මූල්‍යයන අත්පොත අනුව, එක් එක් ව්‍යාපෘති ණය ගෙවීම් කිරීමේදී බැංකුව විසින් කිසිඳු භෞතික ප්‍රගති වාර්තාවක් මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලබාගෙන නොතිබුණි.

(ඇ) වී මිලදී ගැනීම සඳහා 2012 සැප්තැම්බර් 06 හා 2013 සැප්තැම්බර් 02 දින වී අලෙවි මණ්ඩලයට රු.මිලියන 1,200 ක ණය මුදලක් බැංකුව විසින් ලබාදී තිබුණු අතර, 2014 දෙසැම්බර් 31 දිනට මුළු අක්‍රීය ණය ශේෂය රු.මිලියන 1,000 ක් විය. තවද ඇපකරයේ තථ්‍ය වටිනාකමට වඩා රු.මිලියන 64 ක් අඩු භාණ්ඩාගර ඇපකරයක් ලබා ගෙන තිබූ අතර එය 2014 දෙසැම්බර් 31 දිනට කල් ඉකුත් වී තිබුණි.

(ඉ) 2013 ජුනි 27 දින ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට රු.මිලියන 14,227 ක ණය පහසුකමක් බැංකුව විසින් අනුමත කර තිබූ අතර, 2014 දෙසැම්බර් 31 වන විට කරන ලද වියදම රු.මිලියන 1,600 ක් විය. තවද වර්ෂ 5 ක් තුළ කල් පිරෙන බැඳුම්කර යටතේ යෝජනා කරන ලද ණයක් ලෙස මෙම ව්‍යාපෘති ණය හඳුනා ගෙන තිබූ බවත් වර්ෂ 1 ක අනුග්‍රහ කාලයක් සහිතව ආපසු ගෙවීම් කාල පරිච්ඡේදය වර්ෂ 10 ක් ලෙස අනුමත කර තිබූ බවත් නිරීක්ෂණය විය. එයට අමතරව රු.මිලියන 1,100 ක් වූ පළමු වියදම් දෙකම ණය ගිවිසුමකට එළඹීමට පෙර හා ණය සඳහා භාණ්ඩාගාර ඇපකරයක් ලබාගැනීමෙන් තොරව සිදුකර තිබුණි.

**(ඊ) නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකිරීම සඳහා ලබාදුන් ව්‍යාපෘති ණය**

ඉහත කාර්යය සඳහා 1996 වර්ෂය තුළදී රු.මිලියන 50 ක් හා රු.මිලියන 30 ක් වූ ණය දෙකක් සියයට 20 ක පොලී අනුපාතයට පුද්ගලික සමාගමකට ලබාදී තිබුණි. මෙම ණය 1999 ජූලි වන විට සම්පූර්ණයෙන් නිරවුල් කිරීමට අපේක්ෂා කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සම්පූර්ණ ණය මුදල කිසිඳු වාරිකයක් ගෙවීමෙන් තොරව හිඟ මුදලක් ලෙස පැවතුණි.

(ii) 2014 නොවැම්බර් 06 දිනට ඉහත ණය මුදල් සම්බන්ධයෙන් බැංකුවට ගෙවන ලද පොලී පිළිවෙලින් රු.8,524,520 ක් හා රු.1,546,028 ක් විය.

(iii) 2006 මාර්තු 10 දින ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව, ණය මුදල වෙනුවෙන් අත්කරගත් ඉඩමේ ප්‍රමාණය අක්කර 6 රූඩ් 3 පර්චස් 21.75 ක් විය. අදාළ තක්සේරු වාර්තා හා මැණුම් සැලසුම් අනුව ඉඩමේ ප්‍රමාණය අක්කර 6 රූඩ් 2 පර්චස් 12.8 ක් වූ අතර, ඒ අනුව රූඩ් 1 පර්චස් 8.95 ක වෙනසක් විගණනයේදී නිරීක්ෂණය විය.

(iv) ඉහත ණය අයකර නොගැනීමේ ප්‍රතිඵලයක් ලෙස 2014 දෙසැම්බර් 31 දිනට බැංකුවට ලැබිය යුතු පොලී ආදායම හා ප්‍රාග්ධනය රු.185,400,000 ක් විය.

(v) රු.මිලියන 184 ක් වටිනා ඉහත ඉඩමේ කොටසක් ශ්‍රී ලංකා නාවික හමුදාවට පවරා ගෙන තිබූ අතර රු.මිලියන 113 ක් වටිනා ඉඩම බැංකුවට අයත්ව තිබුණි. කෙසේ වුවද බැංකුව විසින් ලබාගෙන ඇති තක්සේරු වාර්තාව අනුව ඉඩමේ සත්‍ය වටිනාකම රු.මිලියන 70.3 ක් වූ අතර ඒ අනුව රු.මිලියන 9.7 ක පාඩුවක් බැංකුව දරා තිබුණි.

(vi) රු.මිලියන 18.8 ක් වටිනා ඉහත ඉඩමේ කොටස් 4 ක් 2009 ජුනි 02 දිනැති අංක 1604/16 හා 2011 ජුනි 02 දිනැති අංක 1708/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීම් මඟින් රජය විසින් අත්පත් කර ගෙන තිබුණි. කෙසේ වුවද මේ සම්බන්ධයෙන් කිසිඳු වන්දි ගෙවීමක් මේ දක්වා රජය විසින් සිදුකර නොතිබුණි.

**(උ) උකස් අත්තිකාරම්**

i. සමාලෝචිත වර්ෂය තුළ ප්‍රසිද්ධ වෙන්දේසි 3 ක් පවත්වා තිබුණද, රු.මිලියන 10,457 ක් වටිනා බේරා නොගත් උකස් භාණ්ඩ බොහෝ ප්‍රමාණයක් වෙන්දේසි කිරීමෙන් තොරව බැංකුව භාරයේ පැවතුණි.

ii. බැංකුවේ ශාඛා 06 ක් විසින් උකස් අත්තිකාරම් ගෙවීමේදී රන් අනුපාතය වැඩියෙන් දැක්වෙන රන් භාණ්ඩ සම්බන්ධයෙන් අවස්ථා 57 කදී රු.13,453,311 ක් වූ ගෙවීම් සිදුකර තිබුණි. එහෙත් පසුව භෞතික පරීක්ෂණයේදී එය සියයට 10 සිට 18 දක්වා අඩු අනුපාත බව නිරීක්ෂණය වී තිබුණි.

**4.5 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රු.9,762,229 ක් පිරිවැය වූ ගොඩනැඟිලි වැඩ බිම් 7 ක් කිසිදු ඉදිකිරීමක් සිදුකිරීමෙන් තොරව කෙරීගෙන යන ගොඩනැගිලි යටතේ දක්වා තිබුණි.

(ආ) 2014 වර්ෂය තුළදී සිදුකිරීමට අපේක්ෂා කරන ලද පහත සඳහන් ඉලක්කයන් සපුරා ගැනීමට බැංකුව අසමත්ව තිබූ බව නිරීක්ෂණය විය.

| විෂයය | ඉලක්කය | ඉටුකර ගැනීම | ඉටුකර නොගැනීම |
|---|---|---|---|
| තැන්පතු වර්ධනය | සියයට 14 | සියයට 10 | සියයට 4 |
| මුළු තැන්පතු (රු බිලියන ) | 650 | 554 | 96 |
| වත්කම් මත ප්‍රතිලාභ (වාර ගණන) | 1.8 | 0.18 | 1.62 |
| සේවකයෙකුට තැන්පතු (රු.මිලියන) | 206 | 165 | 41 |

**4.6 වංචනික ස්වරූපයේ ගනුදෙනු**

පහත සඳහන් අභ්‍යන්තර පාලනයන්ට අනුකූල නොවීම හේතුවෙන් පොතුවිල් ශාඛාව විසින් අඩු කැරට් ප්‍රමාණයක රන් භාණ්ඩ මත එකතුව රු.මිලියන 40.09 ක උකස් අත්තිකාරම් ලබාදී තිබුණි.

දිනය අවසානයට කළමනාකරු විසින් උකස් භාණ්ඩ පිළිබඳ දෛනික භෞතික පරීක්ෂණය සිදු නොකිරීම.

i. වයස අවුරුදු 18 ට අඩු (Minors) පුද්ගලයන් සඳහා උකස් පහසුකම් මත අත්තිකාරම් ලබාදීම.
ii. උකස් භාණ්ඩ පිළිබඳ අයිතිය සම්බන්ධයෙන් සහතිකයක් ලබා නොගැනීම.
iii. පූර්ව අනුමැතීන් නොමැතිව උකස් අත්තිකාරම් ලබාදී තිබීම.

**4.7 ආර්ථික නොවූ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 ජනවාරි 29 දින බැංකුව විසින් මිලදී ගන්නා ලද වැතැම් වීදියේ රු.මිලියන 35 ක් වටිනා හෙක්ටයාර් 0.479 ක ප්‍රමාණයකින් යුත් ඉඩම ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් අත්පත් කර ගෙන තිබුණි. ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ නිවේදනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ 2009 ජුනි 08 දින ප්‍රසිද්ධ කර තිබූ අතර වන්දි ගෙවීම සඳහා පරීක්ෂණය 2012 ජුනි 28 දින සිදුකර තිබුණි. ඒ සඳහා වන්දි ගෙවීම හා පොලී ගෙවීම පරීක්ෂණ දිනයේ පැවති වටිනාකම මත ගෙවන බව කොළඹ ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් ඒ සඳහා කිසිදු වන්දියක් හා පොලී ගෙවීමක් ලැබී නොතිබුණි.

(ආ) බැංකුව සඳහා මහල් 18 ක ගොඩනැඟිල්ලක් ඉදිකිරීම සඳහා 2008 වර්ෂයේ සිට රු.35,228,367 ක මුදලක් වැයකර තිබූ අතර, මෙම ප්‍රදේශය අධි ආරක්ෂක කලාපයක්

යටපත්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය හෝ පෙර වර්ෂ තුළ කිසිදු ඉදිකිරීමක් සිදුකිරීමෙන් තොරව මෙම මුදල කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්වල දක්වා තිබුණි. එබැවින් මේ සඳහා දරන ලද වියදම ඵලරහිත වියදමක් ලෙස දැක්විය හැක.

**4.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

ඉඩම්වල නිත්‍යානුකූල අයිතිය බැංකුවට ලබාගැනීමෙන් තොරව ඉඩම් 8 ක ගොඩනැඟිලි ඉදිකිරීම සඳහා රු.86,935,625 ක මුදලක් බැංකුව විසින් දරා තිබුණි.

**4.9 ආයෝජන**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට මිල ප්‍රකාශිත සමාගම් 44 ක කොටස්වල සමස්ත ආයෝජන පිරිවැය රු.7,186,057,572 ක් විය. මෙම මිල ප්‍රකාශිත සමාගම් 44 කින් 32 ක වෙළඳපොළ අගය 2014 වර්ෂය තුළ රු.1,102,083,766 කින් හීනවී තිබුණි. ඒ අනුව 2014 දෙසැම්බර් 31 දිනට ආයෝජනය කර තිබූ සමස්ත කොටස්වල වෙළඳපොළ අගය රු.1,102,083,766 කින් හීනවී තිබුණි.

(ආ) මිල ප්‍රකාශිත සමාගම් 14 ක කරන ලද ආයෝජනයෙන් කිසිඳු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණු අතර 2014 දෙසැම්බර් 31 දිනට ආයෝජන වටිනාකම රු.1,086,087,759 ක් විය. තවද වෙළඳපොළ වටිනාකම අහිමිවූ මිල ප්‍රකාශිත සමාගම් 07 ක බැංකුව විසින් රු.777,483,527 ක් ආයෝජනය කර තිබූ බවත් වර්ෂ 3 කට වැඩි කාලයක් කිසිඳු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණු බවත් අනාවරණය විය.

(ඇ) 2013 වර්ෂයේදී වෙළඳපොළ වටිනාකම පිරිහී තිබුණු මිල ප්‍රකාශිත සමාගම් 18 ක කොටස්වල සමාලෝචිත වර්ෂය තුළ රු.876,835,323 ක මුදලක් ආයෝජනය කර තිබුණි. තවද සමාලෝචිත වර්ෂය තුළ මිල ප්‍රකාශිත සමාගම් 3 ක රු.48,428,710 ක මුදලක් ආයෝජනය කර තිබූ අතර ඒ සඳහා කිසිඳු ලාභාංශයක් ලැබී නොතිබුණි.

(ඈ) රු.10,000,000 ක් වූ කොම් ට්‍රස්ට් හිමිකම් අරමුදලේ (Com Trust Equity Fund) ආයෝජනයෙන් මුළු කාල පරිච්ඡේදය (වර්ෂ 22) සඳහා ලැබුණු මුළු ප්‍රතිලාභය වර්ෂයකට සියයට 5.09 ක් නියෝජනය වන රු.9,159,245 ක් පමණක් විය. පසුගිය වර්ෂ 22 තුළ ස්ථාවර තැන්පතු සඳහා බැංකුව විසින් ගෙවන ලද සාමාන්‍ය පොලී ප්‍රතිශතය වර්ෂයකට සියයට 12.75 සිට සියයට 10.77 ක පරාසයක විය. ගනුදෙනුකරුවන්ට ගෙවන ලද සාමාන්‍ය පොලී අනුපාතය සැලකීමේදී ඒකක භාර මත රු.15,766,833 සිට රු.11,691,333 ක පරාසයක ප්‍රතිලාභයක් බැංකුව විසින් අහිමි කර ගෙන තිබුණි.

**5. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා බැංකුවේ අනුමත කාර්ය මණ්ඩලය 3,927 ක් වූ අතර, ස්ථිර සේවකයන් 2,815 ක්, අභ්‍යාසලාභීන් 162 ක් හා කොන්ත්‍රාත් පදනම මත 381 ක් ඇතුළත් සේවකයින් 3,358 ක් බැංකුව විසින් සේවයේ යොදවා ගෙන තිබුණි. තවද විගණනයට ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2014 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු 634 ක් පැවති අතර අතිරික්ත කාර්ය මණ්ඩලය 65 ක් විය. කෙසේ වුවද 2014 දෙසැම්බර් 31 වන විටත් එම පුරප්පාඩු පිරවීම සඳහා පියවර ගෙන නොතිබුණි.

(ආ) ලිඛිත විභාග පැවැත්වීම මගින් බැංකුව විසින් 2005 වර්ෂය දක්වා බැංකු සහකාරවරුන් බඳවා ගෙන තිබුණද, 2006 සිට 2014 දක්වා විභාග පැවැත්වීමෙන් තොරව සම්මුඛ පරීක්ෂණ මත පදනම්ව බැංකු සහකාරවරුන් 1,211 ක සංඛ්‍යාවක් බඳවා ගෙන තිබුණි. එසේ බඳවා ගත් කාර්ය මණ්ඩලයෙන් දකුණු පළාතෙන් සියයට 47 ක් හා බස්නාහිර පළාතෙන් සියයට 23 ක් නියෝජනය විය.

(ඇ) ක්‍රමවත් සැලැස්මක් නොමැතිවීම හා 2011 වර්ෂයේ සිට බැංකුවේ නාම යෝජනා කමිටුවේ අක්‍රියත්වය හේතුවෙන් බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු වර්ෂයකට වැඩි කාලයක් පුරප්පාඩුවී පැවතුණි.

**6. පද්ධති හා පාලන**

**--------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර බැංකුවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ණය හා අත්තිකාරම් ගෙවීම සහ නිරවුල් කිරීම
(ආ) බැංකු මෙහෙයුම් පිළිබඳ ලේඛන පවත්වාගෙනයාම
(ඇ) ස්ථාවර වත්කම් පාලනය
(ඈ) උකස් කිරීම් පද්ධතිය පිළිබඳ පාලනය
(ඉ) ශාඛා මෙහෙයුම්වල අඩුපාඩු